අ.පො.ස.(උ.පෙළ) 2025

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව- උතුරුමැද

දේශීය නර්තනය

**පිළිතුරු පත්‍රය**

**I කොටස**

1) 3
2) 1
3) 1
4) 2
5) 1
6) 5
7) 1
8) 5
9) 1
10) 3
11) 4
12) 5
13) 3
14) 1
15) 5
16) 3
17) 5
18) 2
19) 3
20) 2
21) 3
22) 3
23) 1
24) 4
25) 2

26. 1953
27. බැල්තසාර් බියුජෝක්ස්
28. කෝච්චිය
29. සුවඳමල් අමාත්‍ය නැටුම
30. කොවුලා
31. ප්ලුත
32. උඩැක්කිය
33. ශුද්ධ මාත්‍රා
34. රාජ
35. නිශ්ශංක මල්ල
36. $(i)$ වලියක් මංගල්‍යය $(ii)$ කිරි මඩුව
37. $(i)$ කොට්ටෝරුවා $(ii)$ නෙල්ලි කොත්තුවා
38. $(i)$ මනිපුරි $(ii)$ කථකලි
39. $(i)$ 1914 $(ii)$ නෙළුම් පොකුණ
40. $(i)$ නාට්‍ය ධර්මි $(ii)$ ලෝක ධර්මි
41. $(i)$ කථක් $(ii)$ භරත
42. $(i)$ සන්නි යකුම (18 සන්නිය) $(ii)$ රීරි යකා
43. $(i)$ ධාරා පහන $(ii)$ තිත් පහන
44. $(i)$ රට යකුම $(ii)$ කුමාර සමයම
45. $(i)$ අණ්ඩාකාර $(ii)$ සමචතුරස්‍ර
46. $(i)$ පහතරට නර්තන සම්ප්‍රදාය $(ii)$ සබරගමු නර්තන සම්ප්‍රදාය
47. $(i)$ ආවැන්දුම $(ii)$ පහතරට
48. $(i)$ කෝට්ටේ $(ii)$ පැරකුම්බා සිරිත

49. $(i)$ වලියක් මංගල්‍ය/කොහොඹා කංකාරිය $(ii)$ බලි ශාන්තිකර්මය

50. $(i)$ උඩැක්කිය $(ii)$ තම්මැට්ටම

## II කොටස

1. $(i)$

* උඩරට

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ත | ක | ට | ත | ක | ට | කු | ද | තක් | - | ක | ඩ | ක | ඩ | කු | ද |
| තක | ටක | කට | කුද | තක් | කඩ | කඩ | කුද | තක | ටක | කට | කුද | තක් | කඩ | කඩ | කුද |

* පහතරට

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| කි | ටි | ත | ක | කි | ටි | ගු | ද | කි | ටි | ත | ක | කි | ටි | ගු | ද |
| කිටි | තක | කිටි | ගුද | කිටි | තක | කිටි | ගුද | කිටි | තක | කිටි | ගුද | කිටි | තක | කිටි | ගුද |

* සබරගමු

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ත | රි | කි | ට | දි | රි | කි | ට | ත | රි | කි | ට | දි | රි | කි | ට |
| තරි | කිට | දිරි | කිට | තරි | කිට | දිරි | කිට | තරි | කිට | දිරි | කිට | තරි | කිට | දිරි | කිට |

✓ නිවැරදි විභාග හා සංකේත භාවිතයට ලකුණු - 02
✓ බෙර සරඹය නිවැරදිව ප්‍රස්තාර කිරීමට - 04
✓ මුළු ලකුණු (02 + 04) - 06

$(ii)$

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | | / | | | | ^ | | | / | | | |
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| තු | රු | - | රත් | - | න | - | සි | රි | - | ලෙ | - | සි | - |
| නා | - | - | + | + | ති | - | ලි | න | - | නෙ | - | ක | - |
| දෙ | න | - | නිත් | - | ය | - | සන් | - | - | තො | - | සි | - |
| නා | - | - | - | - | - | - | | | | | | | |

✓ නිවැරදි විභාග හා සංකේත භාවිතයට ලකුණු - 02
✓ කවි පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට - 04
✓ මුළු ලකුණු (02 + 04) - 06

(*iii*)

* උඩරට - මයුරා වන්නම

| | ∧1 | 2 | ∧1 | 2 | /1 | 2 | 3 | ∧1 | 2 | ∧1 | 2 | /1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අඩව්ව | + | + | + | + | තහර් | ජිං | ගත | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත |
| | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | + | + | + | + | තහර් | ජිං | ගත |
| | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - |
| | + | + | + | + | තහර් | ජිං | ගත | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත |
| | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - |
| | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - |
| | කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| | කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| | කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිං | ගත | කුං | තක | ජිං | කුඳ | ගජ් | ජිං | ගත |
| | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | ගත් | - | තත් | - | ත | ක | ට |
| | තරි | කිට | කුං | දත් | තා | | | | | | | | | |

* පහතරට - ශුද්ධ තාලය සින්දු වන්නම

| | ∧1 | 2 | ∧1 | 2 | /1 | 2 | 3 | ∧1 | 2 | ∧1 | 2 | /1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉරට්ටිය | තත් | - | ගු | ඳ | ග | ත | - | දිත් | - | දිත් | - | තෙයි | - | - |
| | ග | ත | ගු | ඳ | ග | ත | - | දිත් | - | දිත් | - | තෙයි | - | - |
| | තත් | - | ගු | ඳ | ග | ත | - | ග | ත | ගු | ඳ | ග | ත | - |
| | ගු | ඳ | ගත් | - | ගුඳ | ග | ත | තත් | - | ගු | ඳ | ග | ත | - |
| | දිත් | - | දිත් | - | තෙයි | | | | | | | | | |

* සබරගමු - නාග ගජගා වන්නම

| | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අඩව්ව | ත | හර් | ද | තත් | - | තත් | - | ත | තත් | - | තත් | - | තත් | - |
| | ත | හර් | ද | තත් | - | කි | ට | ත |ක | ට | කු | ඳ | දොං | - |
| | ත | හර් | - | රු | ඳ | දොං | - | ත | හර් | - | රු | ඳ | දොං | - |
| | ත | හර් | - | රු | ඳ | දොං | - | දොං | - | ත | ගත් | - | තත් | - |
| | ග | තත් | - | කු | ඳ | ග | ත | තා | - | - | ගත් | - | තත් | - |
| | ග | තත් | - | කු | ඳ | ග | ත | තා | - | - | | | | |

- ✓ නිවැරදි විභාග හා සංකේත භාවිතයට ලකුණු - 02
- ✓ නිවැරදි පද කොටස් ප්‍රස්තාර කිරීමට - 06
- ✓ මුළු ලකුණු (02 + 06) - 08

❖ 01). $6 + 6 + 8 =$ 20

2. $(i)$

* ඇම්බැක්කේ දේවාලයේ
    - ලී බාල්කයක කැටයම් කර ඇති ලී කෙළී නැටුමෙන්
    - සිව්රැස් පනේලයක කැටම් කර ඇති නළඟන රුව
* ගඩලාදෙණි විහාරයේ ගල් කැටයම්
* බෙන්තොට අසල ගලතපාත විහාරයේ ගල් කැටයම්
* කෑගල්ලේ ගනේගොඩ දේවාලයේ ගල් කැටයම්
* දෙවුන්දර දේවාලයේ ගල් කැටයම්

ආදී ලී කැටයම් හෝ ගල් කැටයම් දෙකක් සාධක ලෙස ගෙන නර්තන කලාව එවකට පැවති තත්වය විස්තර කර ඇත්නම් ,

- ✓ සාධක දෙකට ලකුණු - 2
- ✓ විස්තරයට ලකුණු - 4
- ✓ මුළු ලකුණු (02 + 06) - 6

$(ii)$

* දඹදෙණි යුගයට අයත් තූර්ය භාණ්ඩ නාමලේඛනය
  '' තවද නිසාන, තම්මැට, දවුල්, ලෝහ දවුල්, ..............
* කුරුණෑගල යුගයේ සිංහල ථූපවංශයේ
  '' ගැටබෙර, පනාබෙර, එකැස්බෙර, මිහිඟු බෙර, .............
* කුරුණෑගල යුගයේ දළදා සිරිතෙහි
  ''සක්පංච, චණ්ඩාරු, දලහං, මද්දල, .................
* කුරුණෑගල යුගයේ උම්මග්ග ජාතකයේ
  ''ඒ වේදේහ රජුගේ විදානයෙන් ආතත, විතත, විතතාතත
  ඝන, සුසිර ...............
  - ✓ සාධක දෙකට ලකුණු - 02
  - ✓ විස්තරයට ලකුණු - 04
  - ✓ මුළු ලකුණු (02 + 06) - 06

$(iii)$

* ආගමික පසුබිම
  - දළදා පෙරහැර හා සතර මහා දේවාල පෙරහැර
  - හේවිසි වාදන අවස්ථා
  - සුවිසි විවරණ, සත් සති, පන්සාලිස් වස ආදි නෘත්‍ය පූජා
  - නරේන්ද්‍රසිංහ රජුට කංකාරිය පැවැත්වූ බව සිහබා අස්න
* රාජ්‍ය අනුග්‍රහය
  - ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිහ රජුගේ අනුග්‍රහය
  - දෙවන රාජසිංහ රජුගේ අනුග්‍රහය
  - විමලධර්මසූරිය රජුගේ අනුග්‍රහය
  - කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහය
    - ✓ ආගමික පසුබිමට සාධක 2 ක් ඇසුරෙන් විස්තර කිරීමට ලකුණු - 4
    - ✓ රාජය අනුග්‍රහයට සාධක 2 ක් ඇසුරෙන් විස්තර කිරීමට ලකුණු - 4
    - ✓ මුළු ලකුණු (04 + 04) - 8

❖ 02). $6 + 6 + 8 =$ 20

## II කොටස

3. $(i)$

* යක් ඇනුම, ආවැන්දුම, යක්තුම් පදය, පස් පදය, කෝල් පාඩුව, කාලි නැවීම, කුවේණි අස්නය, කොහොඹා හැල්ල, මඩු පුරය, පළවැල දානය, වැදි දානය, පන්දම් පාලිය, කීල පන්දම් නැටීම.
  - ✓ නර්තන අංග 4ක් නම් කිරීමට ලකුණු - 2
  - ✓ ඉන් එකක සුවිශේෂි ලක්ෂණ දැක්වීමට ලකුණු - 4
  - ✓ මුළු ලකුණු (02 + 06) - 6

$(ii)$

* බලි ශාන්තිකර්මයේ චාරිත්‍රවල සුවිශේෂතා
    - බලි මඩුව තැනිම.
    - බලි මැස්ස තැනීම.
    - බලි ඇඹීම සඳහා මැටි යොදා ගැනිම.
    - බලි ඇඹීම හා වර්ණ ගැන්වීම.
    - නේත්‍රා තැබීම.
* වාදන වල සුවිශේෂතා
    - උඩරට, පහතරට, සබරගමුල වන්නිය හා ඌව පදනම් කරගෙන ඊට වෙන් වූ වාද්‍ය භාණ්ඩ භාවිත වන බව. උදා:- ගැටබෙරය, දවුල, පහතරට බෙරය හා උඩැක්කිය ආදිය
    - අත්මිණිය භාවිත කරන බව.
    - ගායනයට උචිත අයුරින් මෘදු ආකාරයට බෙර වාදනය.
    - බලි යාගයේ බෙර සියුම් ආකාරයයෙන් වැයෙන බව.
        - ✓ සුවිශේෂි චාරිත්‍ර 2ක් නම් කර විස්තර කිරීමට ලකුණු - 3
        - ✓ වාදනයේ සුවිශේෂතා දැක්වීමට ලකුණු - 3
        - ✓ මුළු ලකුණු (03 + 03) - 6

$(iii)$

* ආතුරයාට මෙන්ම ඇදුරාට ද ශාන්තිකර්මයේ අන්තර්ගත කරුණු නිසා යටි සිතේ ඇති යම් යම් දේ වෙනස් වී ප්‍රකෘති තත්ත්වයට පත්වන බව.
    - සිත තුළ විවිධ හැඟීම් පහළ වන බව.
    - රට යකුම පැවැත්වීමේ හේතු ඇසුරෙන් මානසික සුවයක් ලැබෙන බව.
    - ගායන අංග ඇසුරෙන් මානසික සුවයක් ලැබෙන බව.
    - නර්තන අංග ඇසුරෙන් මානසික සුවයක් ලැබෙන බව. (නානුමුරය, කපුයක්කාරිය, දරු නැළවිල්ල)
    - වාදන ඇසුරෙන් මානසික සුවයක් ලැබෙන බව.
    - සැරසිලි ඇසුරෙන් මානසික සුවයක් ලැබෙන බව.
    - රූපණය ඇසුරෙන් මානසික සුවයක් ලැබෙන බව.
    - රංගවස්ත්‍රාභරණ ඇසුරෙන් මානසික සුවයක් ලැබෙන බව.
        - ✓ රටයකුම ශාන්තිකර්මය තුළ විද්‍යාත්මක පසුබිමක් ඇති බව උදාහරණ 4ක් ඇසුරින් සාකච්ඡා කිරීමට ලකුණු $2 \times 4 = 8$ යි.
        - ✓ මුළු ලකුණු 8 යි

❖ 03). $6 + 6 + 8 =$ 20

4. $(i)$

* කිරිමඩුවෙහි පුරාවෘත්තයේ අවස්ථා ඇසුරු කරගනිමින් පහත සඳහන් සාරධර්ම වර්ධනය වන ආකාරය විග්‍රහ කළ යුතු බව.
    - සතුන්ට හිංසා කිරීම අයහපතට හේතු වන බව
    - පාපී ක්‍රියාවලින් වැළකී සිටිය යුතු බව
    - වෛර නොකළ යුතු බව
    - පළිගැනීමෙන් තොර විය යුතු බව
    - කල්‍යාණ මිත්‍ර සේවනය කළ යුතු බව
    - සාමූහිකව වැඩ කටයුතු කළ යුතුබව
    - සමාජ සහජීවනය සහ එකිනෙකා අතර බැඳීම්
        - ✓ විස්තර කිරීමට - 6
        - ✓ මුළු ලකුණු - 6

(ii)

* පැවැත්වීමේ අරමුණු
    - දරුපල නැති ස්ත්‍රීන් හට දරුගැබ් ආරක්ෂාව වෙනුවෙනුත්
    - ගැබ් ගත් ස්ත්‍රීන්ගේ ගර්භය ආරක්ෂා කර ගැනීම සඳහාත්
    - වැඳු ගෙය දෝෂ දුරුකරගැනීම සඳහාත්
      මෙම ශාන්තිකර්මය පවත්වනු ලබන බව
* රටයකුමේ රංගවස්ත්‍රාභරණ
    - නානුමුරයේ ඇඳුම් කට්ටලය හා කපුයක්කාරියේ ඇඳුම් කට්ටලය
    - දරු නැලවිල්ලේ ඇඳුම් කට්ටලය (නානමුරයේ ඇඳුම් කට්ටලයේ යටිකයට සුදු රෙද්දට උඩින් චීත්තයක් අඳී)
    - කුමාර සමයම ඇඳුම් කට්ටලය
    - කුල්ලෙ පිදේනියේ ඇඳුම් කට්ටලය
    - පන්දම් පද නැටීමේ ඇඳුම් කට්ටලය
    - ආතුරයාට සන්නි රෝග ඇත්නම් පාලි හා සන්නි ඇඳුම් කට්ටල
    - මල් අස්න ඇඳුම් කට්ටලය ආදී ඇඳුම් කට්ටල්
        - ✓ පැවැත්වීමේ අරමුණු පැහැදිලි කිරීමට ලකුණු - 3
        - ✓ රංග වස්ත්‍රාභරණ වලට ලකුණු - 3
        - ✓ මුළු ලකුණු (03 + 03) - 6

(iii)

* සන්නිවලින් මතු කරන විවිධ රෝග ලක්ෂණ
    - වාතය ඇසුරෙන් :- වාත සන්නිය/ භූත සන්නිය/ අමුකු සන්නිය/ ගුල්ම සන්නිය/ කොර සන්නිය/මූර්තු සන්නිය
    - පිත ඇසුරෙන් :- පිත් සන්නිය/ දෙමළ සන්නිය/ ගිනිජල් සන්නිය/ නාග සන්නිය/ වෙඩි සන්නිය/ දේව සන්නිය
    - සෙම් ඇසුරෙන් :- සීත සන්නිය/ ගොළු සන්නිය/ කෝල සන්නිය/ අභූත සන්නිය/ බිහිරි සන්නිය

<u>වාත සන්නිය</u>

- වාතය කෝපවීමෙන් ඇතිවන නෙත් රතු වීම, කෑම අරුචිය, නිදිමත බව, ආදී රෝග ලක්ෂණ ඇතුළත්ව ඇති බව.

ඉදිමුම් හිසරද බඩ ලෙඩ වන්නේ

වැඳුම් ගෙයක් මෙන් බලා සිටින්නේ

වෙව්ලුම් ඇඟ තුළ බය නොකරන්නේ

වාත සන්නි කළ ලෙඩ දැනගන්නේ

<u>භූත සන්නිය</u>

- භූත වේශය නිසා ඇතිවන විකාර දෙඩවීම් ආදී ලක්ෂණ ඇතුළත්ව ඇති බව.

<u>අමුක්කු සන්නිය</u>

- ඇස් රතු වීම, කෑම අරුචිය, ඔක්කාරය, දෙඩවීම, කට ඇදවීම, වැනි ලක්ෂණ අන්තර්ගත බව.

<u>ගුල්ම සන්නිය</u>

- උදරගත ගෙඩි, කෑම අරුචිය, අතීසාරය, බඩ වැලේ ගෙඩි, බඩ හෝ ගෑම
    - ✓ සන්නි 4ක් නම් කිරිමට ලකුණු - 2
    - ✓ සන්නිවලින් මතුකෙරෙන දැක්වීමට ලකුණු - 6
    - ✓ මුළු ලකුණු (02 + 06) - 8

5. $(i)$

* අරිවුවේට්ටු
* සුලකු
* කොළදුපරිත්තාල්

<u>අරිවුවේට්ටු</u>

- කෘෂිකර්මාන්තය පදනම් කර ගෙන ඇති බව.
- වී ඉසීමේ සිට ගොයම් කැපීම දක්වා මෙහි දී නිරූපණය වන බව
- දේශීය ගොයම් නැටුමට සමාන බව.
- සරල ඇඳුම් ආයිත්තම් භාවිත වන බව.
- රංග වස්ත්‍රාභරණ, බස් වහර, රංග රටා, වාද්‍ය භාණ්ඩ ආදියෙහි වෙනස්කම් ඇති බව.

<u>සුලකු</u>

- දේශීය කුලු නැටුමට සමාන බව.
- කෘෂිකර්මාන්තය පදනම් කර ගෙන ඇති බව.
- කාන්තාවන්ට ආවේණික බව
- වී පෙළීම පදනම් කරගෙන ඇති බව.

<u>කොළදුපරිත්තාල්</u>

- තේ කර්මාන්තය පදනම් කරගෙන ඇති බව.
- කාන්තාවන් පමණක් නර්තනයේ යෙදෙන බව.
- සංගීතයට අනුව නර්තනයේ යෙදෙන බව.
- සරල රංග වස්ත්‍රාභරණ භාවිත කරන බව.
- ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම නියෝජනය කරන බව.
- ශෘංගාරාත්මක රංගන විලාශ ඇති බව.
  - ✓ ගැමි නැටුම් 2ක් නම් කිරීමට ලකුණු - 02
  - ✓ ගැමි නැටුම් 2ක් හැඳිනවීමට ලකුණු - 04
  - ✓ මුලු ලකුණු (02 + 04) - 06

$(ii)$

* අණබෙර, නොංචි, ජසයා, ලෙංචිනා, මුදලි වැනි චරිත ඇති බව.
  - විවිධ චරිත සඳහා වෙන් වූ රංග වස්ත්‍රාභරණ භාවිත කරන බව
  - වෙස් මුහුණු පළඳින බව.
  - ගෙජ්ජි හා රහු කුට්ටම් පළඳින බව.
  - හාස්‍යෝත්පාදක ගද්‍ය හා පද්‍ය සංවාද භාවිත කරන බව.
  - පැරණි සමාජයේ දුර්වලතා උපහාසයට ලක් වන බව.
  - පහතරටට ආවේණික පද භාවිත වන බව. (උදා:- ඇහිම්, දොම්, දිතගත)
  - සුවිශේෂි අංග චලන භාවිත කරන බව
  - චරිත හඳුන්වන කෙටි හා දිගු කවි භාවිත කරන බව
    - ✓ කෝලම් නාටකයේ චරිත 2ක් තෝරා ගැනීමට ලකුණු - 2
    - ✓ පහතරට නර්තනයේ ඇති විවිධත්වය චරිත ඇසුරෙන් විමසීමට ලකුණු - 4
    - ✓ මුලු ලකුණු (02 + 04) - 06

$(iii)$

* සමාරෝපණය
* සංවාද භාවිතය (ගද්‍ය පද්‍ය)
* ගායන වාදන
* රංගවස්ත්‍රාභරණ
* රංග උපකරණ
* අනුකරණය
* අනුරූපණය

✓ විධික්‍රම 4ක් නිදසුන් දී විචාරයට කිරීමට $2 \times 4 = 8$

❖ $05). 6 + 6 + 8 =$ 20

6. $(i)$

* සලංගෙයි
  - භරත නාට්‍ය කලාවේ පාදවලට පළඳින ආභරණ වේ.
  - ලෝහවලින් තනා ඇති බව.
  - පාද දෙකටම පළඳින අතර එක් පාදයකට 50ක් 60ක් බැගින් භාවිතා කරන බව.
  - නටුවනාර් විසින් සලංගෙයි පූජාවක් පවත්වා ඒවා පළඳින බව.
  - සලංගෙයි චලනය කරමින් දක්ෂතා පෙන්වන බව. උදා - තිල්ලානා

✓ මාතෘකාව තෝරා ගැනීමට ලකුණු - 02
✓ විස්තරයට ලකුණු - 04
✓ මුලු ලකුණු (02 + 04) - 06

$(ii)$

* මාරියස් පෙටිපා
  - ප්‍රංශ ජාතිකයෙකු බව.
  - 1818 මාර්තු 11 වන දින උපත ලබා ඇති බව.
  - ප්‍රවීන නර්තන ශිල්පියෙකු රංගරචකයෙකු හා ගුරුවරයෙක් බව.
  - රුසියාවේ ශාන්ත පීටර්බර්ග් ඉම්පීරියල් බැලේ පාසලට සම්බන්ධ වී සේවය කළ බව.
  - හංසවිල නිදිකුමරි නට්ක්‍රැකර් යන බැලේ නාට්‍ය සඳහා රංග රචනය කළ බව.
  - ඔපෙරා 35 ක නර්තන නිර්මාණය කළ බව.

✓ මාතෘකාව තෝරා ගැනීමට ලකුණු - 02
✓ මාරියස් පෙටිපාගේ සේවයට ලකුණු - 04
✓ මුලු ලකුණු (02 + 04) - 06

$(iii)$

* පරන් හා ඨුම්රි

<u>පරන්</u>

- පරන් කථක් නර්තන සම්ප්‍රදායට අයත් බව.
- පරන් යනු පක්වාජයෙන් වයන පද විශේෂයක් බව.
- මෙම පද දිගින් වැඩි බව.
- ධා කිටිතක, ධූම තිටිතක, ධෙන්ධෙන්ඩ, තිලංග තිටකධාන, ගෙන්නධාන ආදී අක්ෂර ඇතුළත් බව.
- අද්‍යතනයේදී මෙම පද තබ්ලාවෙන් වයන බව

- පරන් වර්ග ඇති බව.
  උදා - සදා පරන් ,චක්‍රධාර් පරන්,විජිලි පරන්, හස්ති පරන් ආදී වශයෙන්

ඨුම්රි

- කථක් නර්තන සම්ප්‍රදායට අයත් නෘත්‍ය ගණයට අයත් නර්තන අංගයක් බව.
- පසුබිම් ගීතයට අනුව නර්තනය කරන අංගයක් බව.
- භාව ප්‍රකාශනයට ප්‍රධාන තැනක් හිමි වන බව.
- මුල් කාලීන ඨුම්රි තුළ භක්තිය ප්‍රකාශ වන අතර පසුකල ශෘංගාරය දනවන බව.
- ලක්නව් ගුරු කුලය ඨුම්රි ගයමින් නර්තනයට ප්‍රකට බව.
- මහාරාජ් බ්‍රින්දාදීන් තුම්රි ගීත දහස් ගනණකට වඩා රචනා කර ඇති බව.
- සංස්කෘත හින්දි භාෂා වලින් ඨුම්රි රචනා කර ඇති බව.
    - ✓ මාතෘකාව තෝරා ගැනීමට ලකුණු - 02
    - ✓ පරන් විස්තරයට ලකුණු - 03
    - ✓ ඨුම්රි විස්තරයට ලකුණු - 03
    - ✓ මුලු ලකුණු (02+03+03) - 08
    - ✓

❖ 06). $6 + 6 + 8 =$ 20

7. $(i)$

* වාද්‍ය භාණ්ඩ සැකසීමේ සම්මත ශිල්ප ක්‍රම

- තෝරා ගත් ගස්වලින් සම්මත ශිල්ප ක්‍රම මත බෙර කඳන් සකස් කරගන්නා බව
- ගැටබෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ටම හා උඩැක්කිය ආදී වාද්‍ය භාණ්ඩ ශිල්ප ක්‍රම මත සම්මත මිනුම් ක්‍රම පදනම් කර ගනිමින් සකස් කරගන්නා බව
- බෙර කඳන් හාරා ගැනීම, ලියවීම, පදම් කිරීම, බෙර කට සකස් කිරීම ආදිය සඳහා සම්මත ශිල්ප ක්‍රම භාවිත කරන බව
- සම්මත ශිල්ප ක්‍රමවලට අනුව තෝරාගත් සම් කපා ගැනීම, ගොතා ගැනම, සම් එලීම්, බැඳීම් ආදිය ඇති බව
- අවශ්‍ය අමු ද්‍රව්‍ය භාවිත කර ගනිමින් සම්මත ශිල්ප ක්‍රම මත බෙරය සකසා නිම කොට හඬ උත්පාදනයේ ශිල්ප ක්‍රම භාවිත කරගන්නා බව..................... ආදී කරුණු

* චාරිත්‍ර

- සුදුසු දිශාවකට, සුදුසු ස්ථානයකට අනුව චාරිත්‍රානුකුලව ගසක් තෝරාගන්නා බව
- බෙර කඳක් සඳහා තෝරා ගත් ගස වටා පිරිසිදු කරගන්නා බව
- තෝරාගත් ගස වටා ගොක් රැහැන් ඇද නිළ කොට මල් පැළක් තනාගන්නා බව
- තනාගත් මල් පැළ මත පූජා පවත්වා අවශ්‍ය චාරිත්‍ර ඉටු කරගන්නා බව
- සුබ නැකත් අනුව කැපෙන ආයුධයකින් ගසට පහරක් ගසා නමස්කාර කොට ගස කැපීම ආරම්භ කරන බව
- නක්ෂත්‍ර නියමයන්ට අනුව උතුරු සල, පූනා වස නැකතින් ගස කපන බව
- සකසාගත් බෙර කඳට නැකත් හෝරා අනුව හෙණ යෝගයෙන් හම් යොදන බව................

ආදී කරුණු විස්තර කර තිබිය යුතු බව

- ✓ වාද්‍ය භාණ්ඩ සැකසීමේ ශිල්ප ක්‍රම දැක්වීමට හා විස්තරයට ලකුණු - 3
- ✓ චාරිත්‍ර පිළිබඳ දැක්වීමට හා විස්තරයට ලකුණු - 3
- ✓ මුලු ලකුණු (03+03) - 6

$(ii)$

* රංග වින්‍යාසය හා බැඳි මූලික සංකල්ප

චලනය

- ❖ ශක්තිය
- ❖ කාලය
- ❖ වේගය
- ❖ දුර

චලනය කෙරෙහි බලපාන සාධක 04

අවකාශය

- පුද්ගල
- පොදු

තල 3

- ඉහළ තලය
- මැද තලය
- පහළ තලය

දිශා 10

- ඉදිරිපස දිශාව
- පිටුපස දිශාව
- දකුණු දිශාව
- වම් දිශාව
- ඉහළ දිශාව
- පහළ දිශාව
- ඉදිරිපස දකුණු කෝණ දිශාව
- ඉදිරිපස වම් කෝණ දිශාව
- පිටුපස දකුණු කෝණ දිශාව
- පිටුපස වම් කෝණ දිශාව

සම්බන්ධතා

- ❖ ඉන්ද්‍රියන් අතර
- ❖ කණ්ඩායම් අතර
- ❖ කණ්ඩායම් හා පුද්ගලයෙක් අතර
- ❖ රංග උපකරණ අතර
- ❖ ඇඳුම් පැළඳුම් අතර
- ❖ ගායනා හා වාදන අතර

✓ චලනය, අවකාශය හා සම්බන්ධතා සංකල්ප හඳුන්වාදීමට ලකුණු - 06

$(iii)$

* සාම්ප්‍රදායික දේශීය රංගවස්ත්‍රාභරණයන්හි රංගාභරණ හඳුනාගත යුතු බව
* රංගාභරණ නිර්මාණවලදී විහාර දේවාල ආශ්‍රිතව පවතින චිත්‍ර, කැටයම්, මෝස්තර කෙරෙහි අවධානය යොමු කළ යුතු බව
* ඓතිහාසික පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්හි දක්නට ලැබෙන රංගාභරණ නිරීක්ෂණය කළ යුතු බව
* අදාළ සම්ප්‍රදායට අනුව රංගාභරණ කට්ටලයක් තෝරාගත යුතු බව
* තෝරාගත් රංගාභරණ පිළිබඳ නිරීක්ෂණය කළ යුතු බව (හැඩ, මෝස්තර, නිරීක්ෂණ ශිල්ප ක්‍රම, සම්මත මිමි)
* රංගාභරණ දළ රූපයක් පළමුව ඇඳ ගතයුතු බව
* අමුද්‍රව්‍ය වගුවක් සකසා ගත යුතු බව
* අවශ්‍ය අමුද්‍රව්‍ය රැස් කරගෙන තෝරාගත් සම්ප්‍රදායට අදාළව වර්ණ, හැඩතල, රේඛා, මෝස්තර ඇසුරු කරගනිමින් රංගාභරණයන් නිර්මාණය කළ යුතු බව
* නිමවා ගත් රංගාභරණ කට්ටලය කැටයම් යොදා වර්ණ ගන්වා ශරීරයේ අවශ්‍ය තැන්වලට ගැලපෙන ආකාරයට නිර්මාණය කර ගත යුතු බව
* නිර්මාණය කිරීමේ ශිල්ප ක්‍රම හඳුනා ගත යුතු බව
* රංගාභරණය පළඳින ස්ථාන හඳුනාගත යුතු බව
* ශාරීරික හැඩ හඳුනාගත යුතු බව (ගැහැනු/ පිරිමි)
* පහසුවෙන් පැළඳවීම හා ගැලවීම පිළිබඳව දැනුවත් විය යුතු බව

✓ රංග ආභරණ ආකෘතියක් නිර්මාණය කරගන්නා අයුරු විමසීමට ලකුණු - 08

❖ 07). $6+6+8=$ 20

8. $(i)$

* ජන සන්නිවේදන මාධ්‍ය හඳුනාගෙන තිබීම
* රූපවාහිනී නාලිකා හරහා පැවැත්වෙන නර්තන තරඟ ඇසුරින්
* වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා නර්තනය යොදා ගැනීම තුළින්
* ප්‍රවීණ නර්තන ශිල්පීන් සහභාගි වන සාකච්ඡා මණ්ඩප හා නර්තන වැඩසටහන් මඟින්
* නර්තන අවස්ථා හා නිර්මාණයන් ජන මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමට හැකි වීම තුළින්
  - ✓ නර්තන ගායන වාදන රංග වස්ත්‍රාභරණ හා නව නිර්මාණ වැනි ක්ෂේත්‍රයන් පිළිබඳ විස්තර කිරීමට ලකුණු - 06

$(ii)$

* විවිධ ප්‍රසංගයක් සංවිධානය කිරීමෙන්,
  - ගුරුවරුන්ට, වැඩිහිටියන්ට, නායකයින්ට, ගරු කිරීම.
  - සාමූහිකව කණ්ඩායමක් වශයෙන් වැඩ කටයුතුකිරීම.
  - බෙදා හදා ගැනීම
  - අන් අයගේ කලාකෘති අගය කිරීම
  - සන්නිවේදන කුසලතා වර්ධනය වීම
  - වගකීම් දැරීම හා වගවීම
  - විචාර ශක්තිය හා වින්දන ශක්තිය වර්ධනය
  - මානසික ස්වස්ථතාව
  - සංස්කෘතිය ආරක්ෂා කිරීම ....................

  ආදී සාරධර්ම වර්ධනය තුළින් සමාජ සහජීවනය සිදුවන අයුරු සාකච්ඡා කිරීම
  - ✓ කරුණු 6ක් ඇසුරින් සමාජ සහජීවනය සඳහා බලපාන අයුරු විස්තර කරිමට ලකුණු - 6

$(iii)$

* පැරණි
  - පැරණි රංග භූමිය යන්න හඳුන්වා ඒවායේ සුවිශේෂතා පෙන්වා දිය යුතු බව
  - පැරණි රංගභූමි අලංකරණය සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය කලාත්මකව හසුරුවා ඇති ආකාරය ඇගයීමට ලක් කළ යුතු බව.
  - දේශීය රංග භූමි සැකසීමේ සංවාදයන් දක්වා ඒවායේ ඇති සැරසිලි සඳහා විවිධ ශිල්ප ක්‍රම යොදාගෙන ඇති බව
    (ඇඹීම්, නෙළීම්, ගෙතීම්, කැටයම්, විවීම්)
* නූතන
  - රංග භූමි දක්වා ඒවායේ විශේෂතා පෙන්වා දිය යුතු බව
  - නූතන රංග භූමි අලංකරණයෙන් විවිධ ශිල්ප ක්‍රම විස්තර කළ යුතු බව
  - වේදිකා ආලෝකය, පසුතල නිර්මාණය, තාක්ෂණික ශිල්ප ක්‍රම, ආදිය
    - ✓ පැරණි රංග භූමිය හා රංග භූමි අලංකරණය හඳුන්වාදීමට හා විවිධ ශිල්ප ක්‍රම දැක්වීමට ලකුණු - 4
    - ✓ නූතන රංග භූමිය හා රංග භූමි අලංකරණය හඳුන්වාදීමට හා විවිධ ශිල්ප ක්‍රම දැක්වීමට ලකුණු - 4
    - ✓ මුළු ලකුණු (04+04) - 08

❖ 08). $6+6+8=$ 20